# මතුගම අධ්‍යාපන කලාපය

## විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

| 9 ශ්‍රේණිය | කෘත්‍රිම පරිසරය හා හරිත සංකල්පය | ඒකකය - 13 |
|---|---|---|

01. කාබනික පොහොරක් වන්නේ,

1. යූරියා  2. කොම්පෝස්ට්  3. සුපර් පොස්පේට්  4. පොටෑසියම් සල්පේට්

02. දැනට භාවිත ඉතා කාර්යක්ෂම හා සූක්ෂම ජල සම්පාදන ක්‍රමය,

1. බිංදු ජල සැපයුම  2. භූමි කළමණාකරණය  3. වැව් තැනීම.  4. වැඩි ජලය රැස් කිරීම.

03. හරිත ශාක පරිසරය පිරිසිදු කරයි. එම ප්‍රකාශයට වඩාත් ම හොඳින් ගැළපෙන ප්‍රකාශය,

1. ශ්වසනය  2. ප්‍රභාසංශ්ලේෂණය  3. ප්‍රතිචක්‍රීකරණය  4. ජෛව ප්‍රතිකර්මණය

04. අකාබනික පොහොර යෙදීමේ අවාසියකි.

1. පසෙහි පාංශු ජලය හොඳින් රඳා තිබීම.
2. පසේ ව්‍යුහය වැඩි දියුණු වීම.
3. වගාවට හිතකර ක්ෂුද්‍රජීවීන් ගැඬවිලුන් වැනි ජීවීන් විනාශ වීම.
4. පොහොර සඳහා ඉහළ මිලක් ගෙවීමට සිදුවීම.

05. පලිබෝධයින් මර්ධනය සඳහා යොදා ගත හැකි ශාක වර්ගයන් ය.

1. පැපොල්  2. දහස්පෙතියා  3. මොණරකුඩුම්බිය  4. වෙරළු

06. කොම්පෝස්ට් නිපදවීමට සුදුසුම ද්‍රව්‍යයකි.

1. පොලිතීන්  2. ගොම  3. ප්ලාස්ටික්  4. වීදුරු

07. ස්වාභාවික පරිසරයට සිදුවන හානිය අවම වන ආකාරයට එසේ නැතහොත් හානි නොවන සේ භාණ්ඩ හා සේවා පවත්වා ගෙන යාම.

1. හරිතාගාර ආවරණය යි.  2. හරිත සංකල්පය යි.
3. පරිසර සංරක්ෂණය යි.  4. සම්පත් සීමිතව පරිහරණය යි.

08. පුද්ගලයෙකුගේ ක්‍රියාකලාපය තුළින් වර්ෂයක් තුළ දී වායුගෝලයට මුදා හරින කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය,

1. ප්‍රාශ්වාස වාතය  2. වායු දූෂණය  3. කාබන්පිය සටහන  4. ඉහත කිසිවක් නොවේ

09. හරිතාගාර වායුවක් ලෙස සැලකෙන්නේ,

1. ඔක්සිජන්  2. නයිට්‍රජන්  3. මීතේන්  4. හයිඩ්‍රජන් ක්ලෝරයිඩ්

10. කාබන් මුදා හැරීම වැඩි වශයෙන් ම සිදුවන ක්‍රියාවලිය,

1. ආහාර ගැනීමේ දී  2. කාෂිකර්මාන්තයේ දී  3. ප්‍රවාහනයේ දී  4. ව්‍යායාම කිරීමේදී

ලකුණු 2×10=20

The National e-learning Portal for The General Education

## B කොටස - රචනා

(01). 1. හරිතාගාර වායු වර්ග 2 ක් ලියන්න. ලකුණු 02

2. වාතයට හරිතාගාර වායු එක්වන ක්‍රම 3 ක් ලියන්න. ලකුණු 03

3. හරිත සංකල්පයේ අරමුණු කුමක් ද? ලකුණු 03

4. හරිත ප්‍රවාහණයට ඔබට දායක විය හැකි ආකාර 2 ක් ලියන්න. ලකුණු 02

(02). 1. අපේ රටේ හරිත සංකල්පය භාවිතා වන නිර්මාණයක් ලියන්න. ලකුණු 02

2. මිශ්‍ර බෝග වගාවේ ප්‍රතිලාභ 2 ක් ලියන්න. ලකුණු 02

3. පසු අස්වනු ක්‍රියාවලියට ඇතුලත් පියවර මොනවා ද? ලකුණු 04

4. ප්‍රවාහනයේ දී හරිතාගාර වායු විමෝචනය අවම කිරීමට ගන්නා පෙර සැලසුම් 2 ක් ලියන්න.

ලකුණු 02

(03). 1. ගෝලීය උණුසුම ඉහළ යාම යනු කුමක් ද? ලකුණු 02

2. මිශ්‍ර බෝග වගාවේ දී යොදා ගන්නා බෝග වර්ගයන් 4 ක් සඳහන් කරන්න. ලකුණු 04

3. ජෛව තාක්ෂණය යොදා ශාක ප්‍රභේද වැඩි දියුණු කිරීමේ දී ලැබෙන වාසි 2 ක් ලියන්න.

ලකුණු 02

4. මේ සඳහා උදාහරණ ශාක 2 ක් ලියන්න. ලකුණු 02